SLCF

2021

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම

இலங்கை காலநிலை நிதியம் (தனியார்) நிறுவனம்

Sri Lanka Climate Fund (Pvt.) Limited

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

Annual Report

පටුන

01. අධ්‍යක්ෂ මණ්ඩලය 3

සභාපතිගේ සමාලෝචනය 3

කාර්ය මණ්ඩලය 4

02. **හැඳින්වීම** 5

2.1.දැක්ම 5

2.2.මෙහෙවර 5

2.3.ආයතනික අරමුණු 5

2.4.ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ දායකත්වය 7

03.ආයතනික ගමන්මග 11

04.සේවාවන් 13

4.1හරිතාගාර වායු සත්‍යාපනය 13

4.1.1හරිතාගාර වායු සත්‍යාපන අංශයේ වාර්ෂික ප්‍රගතිය -2021 14

4.2ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS) 15

4.2.1. ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික ප්‍රගතිය 15

4.3පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM) 16

4.3.1පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණ ව්‍යාපෘතිවල වාර්ෂික ප්‍රගතිය 2021 16

4.4 ශුද්ධ ශූන්‍ය බලශක්ති සහතිකකරණය (Net Zero Energy) 16

4.5 දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification) 17

4.6 උපදේශන සේවාවන් 18

4.7 ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය 18

06. මූල්‍ය ප්‍රගතිය 21

2021 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශය 21

2021 දෙසැම්බර් මස 31 දිනට හිමිකරු වෙනස්වීමේ ප්‍රකාශය 23

2021 දෙසැම්බර් මස 31 දිනෙන්අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 24

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 25

2021 දෙසැම්බර් මස 31 මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන 26

විගණන වාර්තාවන් 30

විගණන වාර්තාවන් සඳහා පිළිතුරු 40

01. අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිගේ සමාලෝචනය



2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමට අදාළ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි. ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳ දළ විශ්ලේෂණයක් සහ උපායමාර්ගික උපදෙස් ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ යාවත්කාලීන කිරීමක් මෙම වාර්තාව මඟින් සපයයි.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් තිරසාර පරිසරයක් උදෙසාවූ ව්‍යාපෘතීන් හා උපදේශන සේවාවන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි. ISO 14064 – 1:2018 හා ISO 14067:2018 යනාදී අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා පිරිනමනු ලබයි. එසේ පිරිනමනු ලබන්නේ එම ආයතන විසින් ගණනය කරන ලද හරිතාගාර වායුවිමෝචනය අප ආයතනය විසින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුවයි. ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ සෘජු අධීක්ෂණය යටතේ පරිපාලනය කරනු ලබන ජාතික හරිතාගාර වායු වැඩසටහනක් ලෙස ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය අප සමාගම විසින් සිදු කරනු ලබයි.

රට තුල පරිසර සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීමට අප දරන උත්සාහය සහ සේවාදායකයා වෙත ඉහල සේවයක් ලබාදීමට ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් දරන කැපවීම පිලිබඳව අප නිහතමානීව ආඩම්බර වෙමු. අපගේ වටිනා සේවා දාමය අඛණ්ඩව ප්‍රශස්ථ මට්ටමේ රඳවා තබා ගැනීමට මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි පවත්වා ගැනීමට, කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමටද සමාගම නිරන්තරයෙන් උත්සාහ කරනු ලබයි.

තිරසාර ආර්ථික සංවර්ධනයක් වෙත දායක වෙමින් සමාගම දිගුකල් පවත්නා සමාගමක් බවට පත් කිරීමට අනාගතයේදී අපට හැකියාව ලැබෙන බව ශුභවාදීව සහ විශ්වාසයෙන් සිටිමු. ඉදිරියේදී පැන නැගිය හැකි අභියෝග ජය ගනිමින් ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම ලාභ උපයන රාජ්‍ය සමාගමක් බවට පරිවර්තනය කිරීමට අප සතු මිල කළ නොහැකි මානව ප්‍රාග්ධනය උපයෝගී වනු ඇතැයි මම තරයේ විශ්වාස කරමි.



සිරිපාල අමරසිංහ මහතා - අධ්‍යක්ෂ

(සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය)



ආචාර්ය බී. එම්.එස්. බටගොඩ මහතා - අධ්‍යක්ෂ

ක්ෂේත්‍ර විශේෂඥ



වී. ඉරේෂා දිල්හානි මහත්මිය - අධ්‍යක්ෂ

(අධ්‍යක්ෂ, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව)

කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම සභාපති, ප්‍රධාන විධායක නිලධාරි ,තාක්ෂණික සහ තාක්ෂණික නොවන නිලධාරීගෙන් සමන්විත වේ. තාක්ෂණික කණ්ඩායම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් ලබා දී ඇති නිපුණතා අවශ්‍යතා (ISO 14066) සාර්ථකව සපුරා ඇත.

02. හැඳින්වීම

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම 2008 අප්‍රේල් 09 වන දින සමාගම් අංක පී වී 63781 යටතේ 2007 අංක 07 දරන සමාගම් පනතින් පිහිටුවන ලද රජය සතු සමාගමක් වන අතර 2020 සැප්තැම්බර් 25 වන දින ගැසට් වන ලද අති විශේෂ ගැසට් පත්‍රය මගින් පරිසර අමාත්‍යාංශ විෂය පථය යටතට ඇතුලත් කර ඇත. සමාගම මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා තිරසාර පාරිසරිකත්ව ව්‍යාපෘතීන් රැසක් දේශීයව හා විදේශීයව ක්‍රියාත්මක කරනු ලබයි. ආරම්භයේ දී ශ්‍රී ලංකා කාබන් අරමුදල (පුද්ගලික) සමාගම යනුවෙන් හැඳින්වුවද, පසුව ආයතනය විසින් ඉටු කරනු ලබන විවිධ පාරිසරික ව්‍යාපෘතීන් සැලකිල්ලට ගෙන එම කාර්ය භාරයය තව දුරටත් පුළුල් කරගැනීම සඳහා 2016 ජනවාරි 29 වන දින සිට ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම ලෙස අප සමාගම් නාමය වෙනස් කරන ලදී.

සමාගමේ ප්‍රමුඛතම අරමුණ වන්නේ කාබන් විමෝචන සත්‍යාපනය තුළින් අඩු කාබන් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා දායක වීමයි. තවද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාබන් විමෝචන කාර්යය සාධනය ප්‍රශස්ථ කරලීමට මඟපෙන්වීම ද සිදු කරනු ලැබේ.

2.1.දැක්ම

කාබන් උදාසීන හා දේශගුණික ප්‍රත්‍යාස්ථික නීල හරිත ආර්ථිකය.

2.2.මෙහෙවර

කාබන් අවම හා දේශගුණික ප්‍රත්‍යාස්ථික නීල හරිත සංවර්ධනයක් සඳහා ශ්‍රී ලාංකිකයන්ට සහාය වීම.

2.3.ආයතනික අරමුණු

I. එක්සත් ජාතීන්ගේ දේශගුණ වෙනස්වීම පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) සහ කියෝතෝ සම්මුතියෙහි (Kyoto Protocol) ඇතුළත් පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (Clean Development Mechanism –CDM) ඇතුළු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

II. පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණයට අදාළ ව්‍යාපෘති සංවර්ධනය සඳහා පුද්ගලික රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන්ට උපදේශන සේවා සැපයීම, පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණට අදාළ

ව්‍යාපෘති වලංගුකරණය (Validation) සහ සත්‍යාපනය (Verification) සඳහා පුද්ගලික සහ රාජ්‍ය ආයතනයන්ට පහසුකම් සැපයීම සහ හරිතාගාර වායු විමෝචනය අඩු කරන ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පත් ලබා දීම.

III. පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය යටතේ සහතික කරන ලද හරිතාගාර වායු විමෝචන අඩු කිරීම (Certified Emission Reduction-CER) සහ ස්වේච්ඡා යාන්ත්‍රණයක් (Voluntary Mechanism) මඟින් සහතික කරන ලද හරිතාගාර වායු විමෝචන අඩු කිරීම් (Verified Emission Reduction) හා කාබන් වෙළෙඳාම.

IV. පාරිසරික තක්සේරුකරණය ඇතුළු පාරිසරික නිෂ්පාදන අලෙවිකරණ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

V. ආයතනික ව්‍යාපෘති සහ නිෂ්පාදන මට්ටමේ හරිතාගාර වායු විමෝචන ප්‍රමාණීකරණය සහ සත්‍යාපනය සඳහා ක්‍රියා කිරීම.

VI. පරිසර තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාගාර සේවා සැපයීම.

VII. පාරිසරික සංචාරක කර්මාන්තය ඇතුළු පාරිසරික නිෂ්පාදන අලෙවිකරණ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

VIII. ජෛව අපේක්ෂක වැඩසටහන් (Bio-prospecting programme) සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

IX. සනීපාරක්ෂ කසළ බැහැර කිරීම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

X. වාණිජ වශයෙන් ශක්‍ය වෛද්‍ය සහ අන්තරායකර අපද්‍රව්‍ය දහනයන් සංවර්ධනය සහ පවත්වාගෙන යාම.

XI. ව්‍යාපෘති සංවර්ධකයින්ට අවශ්‍ය ඕනෑම සහාය සේවාවන් ලබා දීම.

XII. පාරිසරික නිෂ්පාදන සහ සේවා සංවර්ධකයින්ට සාධාරණ කොන්දේසි යටතේ මූල්‍ය සහාය ලබා දීම.

XIII. පාරිසරික සේවා සහ පරිසර දූෂණය වෙනුවෙන් භාවිත ගාස්තුවක් අය කිරීම සහ ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ ඔස්සේ තෝරා ගත් කර්මාන්තකරුවන්ට සහ ව්‍යාපාර සමූහයන්ට පාරිසරික සේවා සැපයීම.

XIV. හරිත වාර්තාකරණය (Green Reporting) ප්‍රවර්ධනය කිරීම උදෙසා පුද්ගලික සමාගම්වලට සහ නියෝජිතයතනයන්ට සහාය වීම.

XV. තිරසාර සංවර්ධන ක්‍රීයාකාරකම් සඳහා අරමුදල් ආයෝජනය කිරීම.

XVI. පරිසරයට සම්බන්ධ ඕනෑම ආකාරයේ පාරිසරික ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම.

XVII. ශ්‍රී ලංකාව හරිත ආර්ථිකයක් (Green Economy) කරා පරිවර්තනය කිරීමට අදාළ ඕනෑම කටයුත්තක් ක්‍රියාවට නැංවීම.

2.4.ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ දායකත්වය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමෙහි අරමුණ වන්නේ ව්‍යාපාරික ආර්ථිකයන්හි කාබන් අවම කිරීම සඳහා පහසුකම් සැපයීමයි. කාබන් අවම කිරීම සඳහා ගත හැකි විසඳුම්, ඵලදායි ලෙස වැඩි දියුණු කිරීමත්, නව්‍ය උපාය මාර්ග ගවේෂණය කිරීමත්, පවතින පහසුකම් තුල කාබන් විමෝචනය ප්‍රශස්ථ කිරීම සඳහා මඟ පෙන්වීමත් අප ආයතනය මගින් සිදු කෙරේ. ඒ අනුව කර්මාන්තවල පාරිසරික පියසටහන අවම කරමින් එම ආයතන වල තිරසාර ව්‍යාපාරික භාවිතයන් වැඩි දියුණු කරගැනීමට සහ ව්‍යාපාර වල පාරිසරික ගුණාත්මකභාවය වැඩි දියුණු කරගැනීමටද පහසුකම් සපයනු ලබයි.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ISO 14064 – 1:2018 හා ISO 14067:2018 යනාදී අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික අයතන සඳහා පිරිනමනු ලබයි. ආයතන විසින් ගණනය කරනු ලබන හරිතාගාර වායුවිමෝචනය සමාගම මගින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුව එම සහතික පත් පිරිනමනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ඉහත සඳහන් සත්‍යාපනය ක්‍රියාවලිය සඳහා සමාගමට අවසර ලබා දී ඇති අතර එය දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද පිළිගැනීමට ලක් වේ. ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම දේශීය ව්‍යාපාර ආයතන සඳහා ගුණාත්මක සත්‍යාපන සේවා සැපයීමෙන් එම ආයතනවලට ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත යෑම පහසු වී ඇත. එමෙන්ම මෙම දායකත්වය තුලින් ගෝලීය දේශගුණ ක්‍රියාකාරකම් වලට එහි විනිවිදභාවය හා වගකීම් සහගත බව පෙන්නුම් කිරීමට ද අවස්ථාව උදාවී ඇත.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ සෘජු අධීක්ෂණය යටතේ පරිපාලනය කරනු ලබන ජාතික හරිතාගාර වායු වැඩසටහනක් ලෙස ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය සමාගම හරහා සිදු කරනු ලබයි. මෙම යෝජනා ක්‍රමය මගින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරන ව්‍යාපෘති ලියාපදිංචි කරන අතර අපේක්ෂිත පාර්ශ්ව සඳහා ගුණාත්මක බව තහවුරු කළ ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩුකිරීම් (SCER) නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය මඟින් කාබන් වෙළඳාමට පහසුකම් සැලසීමත්, ව්‍යාපාරවලට කාබන් ඉවත් කිරීමේ ව්‍යාපෘති සඳහා ආයෝජනය කළ හැකිවීමත් සහ එම විමෝචනය පියවා ගැනීමට වේදිකාවක් නිර්මාණය කිරීමත් සිදුකරයි. මෙය පාරිසරික වගකීම ප්‍රවර්ධනය කිරීමට අමතරව, තිරසාර අනාගතයකට ද දායකත්වය දැක්වීමක් ලෙසද පෙන්වා දිය හැක.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායුවිමෝචනය අවම කිරීම සඳහා පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරිගැන්වීම හා පහසුකම් සැපයීම සිදුකරනු ලබයි. තවද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ව්‍යාපෘති

සැලසුම් ලේඛනය (PDD), අධීක්ෂණ වාර්තාව (MR) සකස් කිරීම සහ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රය (CMD) යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩුකිරීම් (CER) නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයයි. එමෙන්ම බලශක්ති විගණනය යටතේ ක්ෂේත්‍රයේ විශේෂඥයින් හා තාක්ෂණික උපකරණ මගින් බලශක්ති විගණනයක් සිදුකර එය පරිසර හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කර ඒ සඳහා එම ආයතන ගත යුතු ක්‍රියාමාර්ග යෝජනාකර ඒ සඳහා දිරි ගන්වගන්වනු ලබයි. කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා තීරණ ගැනීමට අවශ්‍ය මගපෙන්වීම හා නායනක්වය සැපයීමද තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය (GR) සඳහා උපදේශන සේවාවන් සැපයීමද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම හරහා සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් විවිධ පාරිසරික හා දේශගුණික විපර්යාසය සම්බන්ධ ව්‍යාපෘතීන් හා අරමුදල් කළමණාකරණය සිදුකරයි. ගෝලීය පරිසර පහසුකම් අරමුදලෙන් ක්‍රියාත්මක කරන ලද නූතන පෙව බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතීන් ලෙස,

- හරිත ලංකා
- ජාතික අනුහුරුවීමේ සැලසුම
- අපේක්ෂිත ජාතික නිර්ණය කළ දායකත්වය හඳුන්වා දිය හැක.

ජාතික දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා වූ මහ පෙන්වන්නෙකු ලෙසද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම කටයුතු කරනු ලබයි. එමෙන්ම සමස්ත ප්‍රජාවට දේශගුණික ක්‍රියාකාරීත්වයේ විවිධත්වය අවම කිරීමේ සිට අනුවර්තනය දක්වා සමාගමෙන් සපයනු ලබන සේවාවන් අතිවිශාලය. ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ ප්‍රධාන කාර්යයභාරයක් ලෙස පාරිසරික විශිෂ්ටත්වය සඳහා වන ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂා ඉටුකර ගැනීම සඳහා එම සංවිධාන, ව්‍යාපාර සහ ව්‍යාපෘතිවලට සහාය දීම සිදු කරනු ලබයි. එමෙන්ම දේශගුණික අභියෝගවලට එරෙහිව ශ්‍රී ලංකා රජය සහ පුද්ගලික අංශය විසින් ගෙන යනු ලබන වැඩපිළිවෙල සඳහා ද සහය දීමෙන් සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි.
2021 වර්ෂය සඳහා සමාගම විසින් හරිතාගාර වායු විමෝචනය අවම කරගැනීම සඳහා වෙළඳපොල කීර්තිමත් නාම දිනාගත් ආයතන සඳහා හරිතාගාර සත්‍යාපන සහතිකපත් බෙදාහැරීම් කරනු ලැබූ අවස්ථා කිහිපයක් පහතින් දක්වා ඇත.



01

කාගිල්ස් පුද්ගලික සමාගම වෙත GHG සත්‍යාපන ප්‍රකාශය පිරිනැමීම



හොරණ ප්ලාන්ටේෂන් වෙත GHG සත්‍යාපන ප්‍රකාශය පිරිනැමීම



ටෙක්ස්ට්‍රිප් පුද්ගලික සමාගම වෙත GHG සත්‍යාපන ප්‍රකාශය ප්‍රදානය කිරීම



ඇමසන් ට්‍රේඩින් පුද්ගලික සමාගම වෙත GHG සත්‍යාපන ප්‍රකාශය පිරිනැමීම



GHG සත්‍යාපන ප්‍රකාශය බගවන්තලාව තේ වතු පුද්ගලික සමාගම වෙත ප්‍රදානය කිරීම

03.ආයතනික ගමන්මග

2008

පරිසර අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා කාබන් අරමුදල ස්ථාපිත කිරීම

2010

පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණ ව්‍යාපෘති ආරම්භ කිරීම

2013

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති ආරම්භ කිරීම

දේශගුණ කර්මාන්ත හා ව්‍යාපාර සඳහා ස්වෙච්ඡා හරිතාගාර වායු වාර්තා කිරීමේ ප්‍රමිතීන් හා අවශ්‍යතා හඳුන්වා දීම.

2016

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම ලෙස ව්‍යාපාර නාමය වෙනස් කිරීම .

2016

ශ්‍රී ලංකා කාබන් ප්‍රමිතියේ ක්‍රියාකාරී යාන්ත්‍රණය ප්‍රතිව්‍යුහගත කිරීම

2016

ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් ISO 14065 නම් ප්‍රතිතන සහතිකය ලබා ගැනීම

2018

දේශගුණික විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදනය සඳහා ජාතික හරිතාගාර වායු ගණනය කිරීම සහ ලේඛන ගත කිරීම සඳහා කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීම

2020

ශුද්ධ ශූන්‍ය බලශක්ති සහතික කිරීමේ හා කාබන් ධනාත්මක කිරීමේ පද්ධතිය හඳුන්වා දීම



හරිතාගාර වායු සත්‍යාපනය
(ISO 14064 , ISO 14067)



ශ්‍රී ලංකා කාබන්ණය යෝජනා ක්‍රමය



පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය



ශුද්ධ ශූන්‍ය (Net Zero Energy)
බලශක්ති සහතිකකරණය



දේශගුණික ධනාත්මක සහතිකකරණය
(Climate Positive Certification)



උපදේශන සේවාවන්



ව්‍යාපෘති හා මූල්‍ය කළමනාකරණය

04.සේවාවන්

තිරසාර පරිසරයක් ගොඩනැගීම සඳහා සිදු කරනු ලබන ව්‍යාපෘතින් සත්‍යාපනය හා වලංගුකරණය මෙන්ම උපදේශන සේවාවන් සැපයීම සමාගමේ ප්‍රමුඛතම සේවාව වේ. ඒ අනුව සමාගම මඟින් සිදු කරනු ලබන ප්‍රධාන සේවාවන් ලෙස,

- හරිතාගාර වායු සත්‍යාපනය (ISO 14064 , ISO 14067)
- ශ්‍රී ලංකා කාබන්ණය යෝජනා ක්‍රමය (SLCCS)
- පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM)
- ශුද්ධ ශූන්‍ය (Net Zero Energy) බලශක්ති සහතිකකරණනය
- දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)
- උපදේශන සේවාවන්
- ව්‍යාපෘති හා මූල්‍ය කළමනාකරණ ව්‍යාපෘතින් හඳුන්වාදිය හැකිය.

4.1හරිතාගාර වායු සත්‍යාපනය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ISO 14064–1 :2018 හා ISO 14067 :2018 යන අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා දේශීයව හා විදේශීයව පිරිනමනු ලබයි. එම ආයතන විසින් ගණනය කරන ලද හරිතාගාර වායු විමෝචනය සත්‍යාපනය කිරීමෙන් අනතුරුව එම සහතිකපත් පිරිනමනු ලබයි .ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ඉහත සඳහන් සත්‍යාපන ක්‍රියාවලිය සඳහා සමාගමට අවසර ලබා දී ඇත .හරිතාගාර වායු විමෝචන ගණනය කිරීම වාර්ෂිකව සිදු කරනු ලබන අතර තෙවන පාර්ශීය සත්‍යාපනයක් තුලින් එම ආයතනික තොරතුරු සඳහා වටිනාකමක් ලබාදෙනු ලැබේ. මේ අනුව 2021 වර්ෂය සඳහා හරිතාගාර වායු සත්‍යාපනය අංශයට ව්‍යාපෘති 20ක ඉලක්කයක් ලබා දී තිබුන ද නිළධාරීන් සේවයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් එකී ඉලක්කයන් කරා යෑමට අවහිරයක් ඇති විය. නමුත් නව නිළධාරීන් බඳවා ගැනීම තුලින් සත්‍යාපන කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබූ අතර එහි ප්‍රගතිය 2022 වර්ෂයේ දී අත් කරගෙන ඇත.

4.1.1හරිතාගාර වායු සත්‍යාපන අංශයේ වාර්ෂික ප්‍රගතිය -2021

අංකය	ව්‍යාපෘතිය	ප්‍රගතිය
හරිතාගාර වායු විමෝචන ප්‍රකාශනයේ සත්‍යාපනය ආයතනික මට්ටම		
01	සිටිසන් ඩිවලොප්මන්ට් මූල්‍ය ආයතනය (CDB)	සම්පූර්ණ කර ඇත
02	ඊ බී ක්‍රිසි ඇන්ඩ් කෝපරේෂන්	සම්පූර්ණ කර ඇත
03	ඇමසන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්	සම්පූර්ණ කර ඇත
04	MAS හෝල්ඩින් MAS කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්	සම්පූර්ණ කර ඇත
05	MAS හෝල්ඩින් ට්‍රිශේල් ෆැබ්රික් (ප්‍රයිවට්) ලිමිටඩ්	සම්පූර්ණ කර ඇත
06	MAS හෝල්ඩින් ස්ට්‍රිච්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ්	සම්පූර්ණ කර ඇත
07	සීමාසහිත කොත්මලේ කිරි නිෂ්පාදන පුද්ගලික සමාගම	සම්පූර්ණ කර ඇත
08	හොරණ ප්ලාන්ටේෂන් PLC	සම්පූර්ණ කර ඇත
09	කොමර්ෂල් බැංකුව	සම්පූර්ණ කර ඇත
10	අෂ්රොෆ් රෝහල අක්කරපත්තුව	සම්පූර්ණ කර ඇත
11	ලංකා දුම්කොළ සමාගම	තක්සේරුව-ආරම්භක තක්සේරුව
ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති		
01	EMJAY ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්	50% සම්පූර්ණ කර තිබුණි
02	තලවාකැලේ ටී එස්ටේට්	30% සම්පූර්ණ කර තිබුණි
03	සීමාසහිත කාගීල්ස් ෆුඩ්ස් සමාගම	20% සම්පූර්ණ කර තිබුණි
04	නොර් ලංකා පුද්ගලික සමාගම	80% සම්පූර්ණ කර තිබුණි
05	ඇල්පිටිය වැවිලි PLC	80% සම්පූර්ණ කර තිබුණි
06	UNIDIL පැකේජින් PLC	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
07	සීමාසහිත කාගීල්ස් කොලිටි ෆුඩ්ස් පුද්ගිලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි

08	සීමාසහිත කාගීල්ස් කොලිටි කන්ෆෙනරීස් පුද්ගලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
09	බෝඩ්පැක් පුද්ගලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
10	ස්කෑන්වෙල් ලොජිස්ටික් පුද්ගලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
11	සේලයික් පුද්ගලික සමාගම	20% සම්පූර්ණ කර තිබුණි
12	ටෙක්ස්ට්‍රිප් පුද්ගලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
13	හැටන් නැෂනල් බැංකුව	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
14	ලංකා බැංකුව	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
15	සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවර්ස් සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
16	මධ්‍යම පරිසර අධිකාරිය	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි
17	නෙස්ලේ ලංකා PLC	ගිවිසුම්ගත මට්ටමෙහි පැවතිණි

4.2 ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS)

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යනු, ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ සෘජු අධීක්ෂණය යටතේ පරිපාලනය කරනු ලබන ජාතික හරිතාගාර වායු ව්‍යාපෘති වලංගුකරණය හා සත්‍යාපනය කිරීමේ වැඩසටහනයි. මෙම යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරන ව්‍යාපෘති ලියාපදිංචි කරනු ලබන අතර අපේක්ෂිත පාර්ශව සඳහා ගුණාත්මක බව තහවුරු කරන ලද ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩු කිරීම් (SCER) නිකුත් කරනු ලබයි.

2021 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යටතේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දෙකක් ලියාපදිංචි කර පැවතුණි.

4.2.1. ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික ප්‍රගතිය

	ව්‍යාපෘතිය	ප්‍රගතිය
01	NWSDB සූර්ය බල ව්‍යාපෘතිය	සම්පූර්ණයි
02	බගවන්තලාව සූර්ය බන්ඩල් ව්‍යාපෘතිය	සම්පූර්ණයි

4.3 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM)

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM) යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩු කිරීම් (CER) නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයයි. තවද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් ව්‍යාපෘති සැලසුම් ලේඛනය (PDD) හා අධීක්ෂණ වාර්තාව (MR) සකස් කිරීම සිදුකරනු ලබයි.

4.3.1 පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණ ව්‍යාපෘතිවල වාර්ෂික ප්‍රගතිය 2021

01	ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර පවිත්‍රතා සංවර්ධන වැඩසටහන යටතේ ලියාපදිංචි කිරීම	සම්පූර්ණ කර ඇත
	(a) කාබන් බැර කිරීමේ කාලය අලුත් කිරීම	
	(b) සහතික කරන ලද විමොචන අඩු කිරීම් (CER) මුළු ගණන (74, 147 t CO2e) නිකුත් කිරීම	
	(i) බුලතාවත්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය	එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත අධීක්ෂණ වාර්තා (MR) ඉදිරිපත් කර ඇත
	(ii) මස්කෙළිය ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය	
	(iii) දඹුලු ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය	
	(iv) මොරගහ ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය	
	(v) ගෝමලේ ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය	

4.4 ශුද්ධ ශූන්‍ය බලශක්ති සහතිකකරණය (Net Zero Energy)

ශුද්ධ ශූන්‍ය බලශක්ති සංකල්පය යනු බලශක්ති භාවිතය මගින් බලශක්ති සංරක්ෂණ කාර්යක්ෂමතාව සහ එම ආයතනය මගින් සිදු කරනු ලබන පුනර්ජනනීය උත්පාදනය 100% සපුරා ගනු ලැබූ බලශක්ති භාවිතයයි. බලශක්ති සහතික කිරීමේ පද්ධතිය, කාබන් විමෝචනය අඩු කිරීම, බලශක්ති කාර්යක්ෂමතා

තාක්ෂණය දිරිගැන්වීම හා ආයතනික මට්ටමෙන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් සංවර්ධනය කරන ලද සංකල්පයකි.

පුනර්ජනනීය නොවන බලශක්ති භාවිතය ඉක්මවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ව්‍යාපෘති ඇති ආයතන ශුද්ධ ශූන්‍ය බලශක්ති සහතිකකරණය සඳහා සුදුසුකම් ලබයි. මෙම සහතිකකරණයේ ප්‍රතිලාභ ලෙස,

- බලශක්ති භාවිතයෙන් ඇතිවන හරිතාගාර වායු විමෝචනය පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් අඩු කිරීමට හැකිවීම
- ආයතනවලට,අයෝජකයන්ට සහ පාරිභෝගිකයන්ට පරිසර හිතකාමී ව්‍යාපාර වල නිරත වීමට අවස්ථාව ලැබීම
- පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කරන ආයතනවලට ඔවුන්ගේ අතිරික්ත බලශක්ති ප්‍රමාණය අලෙවිකර අමතර ආදායමක් උපයාගැනීමට අවස්ථාව ලැබීම
- පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩිදියුණු කිරීම තුලින් නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට හැකි වීම සහ එම ආයතනවලට දිගුකාලීනව තරඟකාරී වෙළඳපල තුල රැඳී සිටීමට අවස්ථාව ලැබීම
- පොසිල ඉන්ධන මත පදනම් වූ බලශක්ති, ඉතාමත් ඉක්මනින් වෙනස්වන මිල සහ සැපයුමක් සහිත වෙළඳපලක් ඇති බලශක්ති මත යැපීම අවම වීම
- රට තුල සංවර්ධනය සඳහා තරඟකාරී හරිත පරිසරයක් නිර්මාණය වීම සහ දිගුකාලීන පුනර්ජනනීය බලශක්ති කර්මාන්ත ව්‍යාප්තිය ඉහළ යාම.

4.5 දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)

දේශගුණික ධනාත්මක සහතිකකරණය තුලින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමත්, සැලකිය යුතු විමෝචනය අවම කිරීම තුලින් දිගුකාලීන යහපැවැත්මක් ලභාකර ගැනීමටත් මහ පෙන්වීමක් මේ මගින් සිදු වේ. ආයතනයන්හි නිෂ්පාදන සහ සේවාවන්වල වාර්ෂික හරිතාගාර වායු විමෝචන සහතිකකරණය කිරීම මඟින් ඒවායෙහි හරිතාගාර වායු විමෝචනය පියවා ගැනීමට හැකියාව ලැබී ඇත. තවද දේශගුණික ධනාත්මක සහතිකය ලබා ගැනීම සඳහා ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල හරිතාගාර වායු විමෝචනය කෙරෙහි වාර්ෂිකව අවධානය යොමුකිරීම තුලින් ඔවුන්ගේ වාර්ෂික හරිතාගාර වායු විමෝචනය සහ එය සත්‍යාපනය කළ පසු අතිරික්ත ප්‍රමාණය අළෙවි කර ගැනීමට ද අවස්ථාව සැලසේ.

මෙම සහතිකකරණය සඳහා අවශ්‍ය ප්‍රධාන අනුකූලතා

- අපේක්ෂිත ප්‍රමාණාත්මක හරිතාගාර වායු විමෝචන සහතිකය (පිළිගත් තෙවන පාර්ශවයක් විසින් සත්‍යාපනය කරන ලද)
- අපේක්ෂිත පාර්ශවය විසින් කාබන් කලමනාකරණ ව්‍යාපෘති සංවර්ධනය කිරීම සහ ඔවුන්ගේ හරිතාගාර වායු විමෝචන අවම කරගත් පිළිගත් ජාතික හා අන්තර්ජාතික හරිතාගාර විමෝචන ව්‍යාපෘතිගතකරණය
- සහතිකකරණය කරන ලද ව්‍යාපෘති ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක කල යුතු වීම
- අපේක්ෂිත පාර්ශවය ඔවුන්ගේ හරිතාගාර වායු විමෝචනය අතිරික්ත කාබන් ණය සමඟ හිලව් කිරීම කල යුතුය
- දේශගුණික ධනාත්මක සහතිකකරණයට අයත් ක්ෂේත්‍ර
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය
- නව වනවගා කිරීම හා නැවත වනවගාව
- බලශක්ති කාර්යක්ෂමතාවයන් හා සංරක්ෂණය
- නාස්තිය අවම කිරීම ,නැවත භාවිතයට ගැනීම සහ ප්‍රතිචක්‍රීකරණය

4.6 උපදේශන සේවාවන්

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා ගනුදෙනුකරුවන්ට තීරණ ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම හා නායකත්වය උපදේශන සේවාවන් තුළින් සපයනු ලබයි. තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය සඳහා ලියාපදිංචි වීමට ද උපදේශන සේවා සපයනු ලබයි.


4.7 ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම විසින් විවිධ පාරිසරික හා දේශගුණික විපර්යාසය සම්බන්ධ ව්‍යාපෘතීන් හා ව්‍යාපෘතීන්ට අරමුදල් කළමණාකරණය සිදු කරනු ලබයි. එකී ව්‍යාපෘතීන් කිහිපයක් වන්නේ,

- ගෝලීය පරිසර පහසුකම් අරමුදලෙන් ක්‍රියාත්මක කරන ලද නූතන ජෙව බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතීන්
- හරිත ලංකා ව්‍යාපෘතිය
- ජාතික අනුහුරුවීමේ සැලසුම

- අපේක්ෂිත ජාතික නිර්ණය කළ දායකත්වය
- ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ විශේෂිකරණ ක්ෂේත්‍ර
- පුනර්ජනනීය බලශක්තීන්
- අනුවර්තනය හෝ අවම කිරීමට (Adaptation and Mitigation) අදාළ උපදෙස් ලබාදීම
- පාරිසරික ඉංජිනේරුකරණය
- MRV පද්ධති වැඩිදියුණු කිරීම
- ප්‍රජා සංවර්ධනය
- සමාජීය අධ්‍යනයන්

05. අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය - 2021



06. මූල්‍ය ප්‍රගතිය

2021 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශය

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (පුද්ගලික)සමාගම					
2021 දෙසැම්බර් 31					
		2021		2020	
	සටහන්	**රුපියල්**		රුපියල්	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත හා උපකරණ	14	97,656.25		-	
ස්ථාවර තැන්පතු					
ස්ථාවර තැන්පතු	9	10,000,000.00		10,000,000.00	
ජංගම වත්කම්					
තිර රෙදි		-		-	
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු වත්කම්	8	3,736,125.90		2,845,250.00	
මුදල් සහ මුදල් සමාන වත්කම්	10	53,949.27		71,017.00	
		3,790,075.17		2,916,267.00	
මුළු වත්කම්		13,887,731.42		12,916,267.00	
හිමිකම් සහ වගකීම්					
හිමිකම්					
ප්‍රකාශිත ප්‍රාග්ධනය	11	25,000,010.00		25,000,010.00	
රඳවාගත් ලාභය/(අලාභය)		(14,149,443.19)		(13,643,332.00)	
		10,850,566.81		11,356,678.00	
ජංගම නොවන වගකීම්					
ජංගම වගකීම්					
උපචිත ගෙවීම්	12	3,037,164.61		1,559,590.00	
මුළු හිමිකම් සහ වගකීම්		13,887,731.42		12,916,268.00	

ඉහත සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර් කොටසක් වන පිටු මත දිස්වන මූල්‍ය ප්‍රකාශන සටහන් සමඟ ඒකාබද්ධව කියවිය යුතුය.

2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව මම සහතික කරමි.

.....	.....	.....
කළමනාකරු - මානව සම්පත් සහ මූල්‍ය	ප්‍රධාන විධායක නිලධාරී	සභාපති

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමක් සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

මණ්ඩලය වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

.....	.....
අධ්‍යක්ෂ	අධ්‍යක්ෂක

2021 දෙසැම්බර් මස 31 දිනට හිමිකරු වෙනස්වීමේ ප්‍රකාශය

	සටහන	රදවා ගැනීමේ ලාභය/ (අලාභය) රුපියල්	ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල්	එකතුව රුපියල්
2021 ජනවාරි 01 ආරම්භක ශේෂය		(12,872,075.56)	25,000,010.00	11,356,678.24
වර්ෂයේ ලාභය / (අලාභය)		(771,256.20)		(771,256.20)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය (අවසන් ශේෂය)		(13,643,331.76)	25,000,010.00	10,585,422.04
2022 ජනවාරි 01 දිනට ශේෂය		(13,643,331.76)	25,000,010.00	10,585,422.04
වාර්ෂික ලාභය / (අලාභය)	13	196,388.57		
පෙර වර්ෂයේ ගැලපුම්		(702,500.00)		
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		(14,149,443.19)	25,000,010.00	10,585,422.04

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (පුද්ගලික) සමාගම			
මුදල් ප්‍රවාහ ප්‍රකාශය			
2021 දෙසැම්බර් 31			
	2021		2020
	රුපියල් .		රුපියල්
මුදල් ප්‍රවාහ ප්‍රකාශය - මෙහෙයුම් ක්‍රියාකාරකම්			
බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය/(අලාභය)	196,388.57		(771,256.20)
ගැලපුම්			
ක්ෂය වීම	27,343.75		9,679.04
පෙර වසර ගැලපුම්	(702,500.00)		0
	(478,767.68)		(761,577.16)
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්			
වැඩි කිරීම් /(අඩු කිරීම්) සහ ලැබිය යුතු වෙනත්	(890,875.90)		(972,897.40)
(වැඩි කිරීම්)/ (අඩු කිරීම්) අරමුදල් කළමනාකරණ	0		(1,193,000.00)
(වැඩිවීම්)/ (අඩු කිරීම්) අනෙකුත් ගෙවිය යුතු දෑ	1,477,574.61		137,599.67
	107,931.03		(2,028,297.73)
ශුද්ධ මුදල් ප්‍රවාහය - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්	107,931.03		(2,789,874.89)
මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ආයෝජන ක්‍රියාකාරකම්			
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(125,000.00)		0
ශුද්ධ මුදල් ප්‍රවාහය - ආයෝජන ක්‍රියාකාරකම්	(125,000.00)		0
වැඩි වීම් / (අඩු වීම්) මුදල් සහ මුදල් සමාන දෑ	(17,068.97)		(2,789,874.89)
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	71,017.45		12,860,892.34
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	53,949.27		10,071,017.45

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (පුද්ගලික) සමාගම				
විස්තීරණ ආදායම් ප්‍රකාශය				
2021 දෙසැම්බර් 31				
		2021		2020
	සටහන්	රුපියල්		රුපියල්
ආදායම	1	7,124,960.79		4,172,827.00
ව්‍යාපෘති අදාළ සෘජු වියදම්	2	(743,406.21)		(310,222.22)
දළ ලාභය		6,381,554.58		3,862,604.78
අනෙකුත් ආදායම්	3	587,191.78		864,864.64
		6,968,746.36		4,727,469.42
අඩු කිරීම්:				
පෞද්ගලික පිරිවැය	4	5,718,801.87		4,779,063.16
පරිපාලන පිරිවැය	5	1,041,740.13		550,421.97
විකුණුම් සහ බෙදාහැරීමේ පිරිවැය	6	8,500.79		4,160.49
මුල්‍ය සහ අනෙකුත් වියදම්	7	3,315.00		165,080.00
		6,772,357.79		5,498,725.62
ලාභය/(අලාභය) බදු පෙර		196,388.57		(771,256.20)
බදු				-
ලාභය/(අලාභය) බදු පසු		196,388.57		(771,256.20)
අනෙකුත් විස්තීර්ණ ආදායම්				-
මුළු විස්තීර්ණ ආදායම්		196,388.57		(771,256.20)

2021 දෙසැම්බර් මස 31 මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම				
2021 දෙසැම්බර් 31				
මූල්‍ය ප්‍රකාශන සඳහා සවිස්තරාත්මක සටහන්				
		2021		2020
1	**ආදායම**	රුපියල්		**රුපියල්**
	හරිතාගාර වායු සත්‍යාපනය අදායම	6,537,307.75		2,283,157.00
	දේශගුණික ධනාත්මක සහතිකකරණය	31,000.00		-
	ශුද්ධ ශූන්‍ය සහතිකපත් ව්‍යාපෘති සහතිකකරණ ආදායම	36,000.00		-
	උපදේශන සේවා ආදායම	72,636.04		533,000.00
	පුහුණු සහ වැඩමුළු ආදායම	186,000.00		-
	ශ්‍රී ලංකා කාබන් අරය යෝජනා ක්‍රමය ව්‍යාපෘති ආදායම	262,017.00		215,670.00
	කාබන් උදාසීන ව්‍යාපෘති ආදායම	-		200,000.00
	ව්‍යාපෘති කලමනාකරණ ආදායම	-		941,000.00
		7,124,960.79		4,172,827.00
2	**ව්‍යාපෘති සඳහා සෘජු වියදම**			
	ව්‍යාපෘති වියදම් -ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සඳහා වූ වියදම	265,000.00		150,000.00
	ව්‍යාපෘති වියදම් - ශ්‍රී ලංකා කාබන් අරය යෝජනා ක්‍රමය	82,420.79		-
	පුහුණු සහ වැඩමුළු සඳහා වූ වියදම්	109,800.00		-
	ව්‍යාපෘති වියදම් - කාබන් පිය සටහන්	153,925.42		92,222.00
	පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණයසඳහා වූ වියදම්	114,260.00		-
	ජල පිය සටහන වියදම්	18,000.00		-
	උපදේශන සඳහා වූ වියදම්	-		68,000.00
		743,406.21		310,222.00
3	**වෙනත් ආදායම්**			
	පොලී ආදායම	587,191.78		864,864.00
		587,191.78		864,864.00
4	**පෞද්ගලික පිරිවැය**			
	කාර්ය මණ්ඩල වැටුප	3,707,500.00		4,060,400.00
	වියදම් - සේවක අර්ථසාධක අරමුදල	444,900.00		434,400.00
	වියදම් - සේවක භාරකාර අරමුදල	111,225.00		108,600.00
	ජීවන වියදම	694,200.00		-
	වැටුප් දීමනාව	221,459.92		134,349.16
	විශේෂ දීමනාව	300,000.00		-

	ඉන්ධන දීමනා	-		19,600.00
	පාරිතෝෂිකය වියදම්	165,000.00		-
	සේවක සුබසාධන	27,016.95		21,714.00
	දුරකථන දීමනා	47,500.00		-
		5,718,801.87		4,779,063.16
		2021		2020
		රුපියල්		රුපියල්
5	**<u>පරිපාලන වියදම්</u>**			
	ලේකම් ගාස්තු	172,801.39		58,971.00
	නීතිමය ගාස්තු	25,000.00		
	රක්ෂණ ගාස්තු	61,159.65		56,880.00
	දුරකථන ගාස්තු	132,838.48		147,904.00
	වෙබ් අඩවි සඳහා වූ වියදම්	10,500.00		20,150.00
	තැපැල් සහ මුද්දර ගාස්තු	5,745.00		-
	අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	90,000.00		30,000.00
	ඉන්ධන සහ වාහන නඩත්තු වියදම්	134,274.00		203,945.00
	පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර නඩත්තු වියදම්	49,650.00		19,960.00
	විගණන ගාස්තු	185,000.00		-
	මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය වියදම්	44,550.00		850.00
	ක්ෂයවීම්	27,343.75		9,679.00
	ගමන් වියදම්	5,544.73		2,082.93
	වෙනත් වියදම්	22,426.00		-
	වෙළඳ දැන්වීම් වියදම්	59,184.00		-
	සේවක භාරකාර අරමුදල - අධිභාරය	15,723.13		-
		1,041,740.13		550,421.93
6	**<u>විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්</u>**			
	ප්‍රචාරණ වියදම්	8,500.79		4,160.00
		8,500.79		4,160.00
7	**<u>මූල්‍ය සහ වෙනත් වියදම්</u>**			
	සේවක භාරකාර අරමුදල - අධිභාරය	-		1,890.00
	වෙනත් වියදම්	-		159,575.00
	බැංකු ගාස්තු	3,315.00		3,615.00
		3,315.00		165,080.00

8	**<u>ලැබිය යුතු දෑ</u>**			
	ලැබිය යුතු ණයගැති ශේෂය	3,422,354.90		2,662,479.00
	මුදල් අත්තිකාරම්	313,771.00		182,771.00

		3,736,125.90		2,845,250.00
9	**ස්ථාවර තැන්පතු**			
	ස්ථාවර තැන්පතුව ලංකා බැංකුව	10,000,000.00		10,000,000.00
		10,000,000.00		10,000,000.00
10	**මුදල් සහ මුදල් සමාන දෑ**			
	බැංකු ශේෂය	53,949.27		71,017.00
		53,949.27		71,017.00
11	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**			
	ප්‍රකාශිත ප්‍රාග්ධනය	25,000,010.00		25,000,010.00
		25,000,010.00		25,000,010.00
12	**ගෙවිය යුතු දෑ**			
	ගෙවිය යුතු - සේවක අර්ථසාධක අරමුදල	1,395,803.01		945,303.00
	ගෙවිය යුතු - සේවක භාරකාර අරමුදල	150,361.60		138,287.00
	ගෙවිය යුතු විගණන ගාස්තුව	260,000.00		150,000.00
	ගෙවිය යුතු උපයනවිට බදු	326,000.00		326,000.00
	ගෙවිය යුතු පාරිතෝෂිකය	905,000.00		-
		3,037,164.61		1,559,590.00
13	**පෙර වසර ගැලපීම**			
	පාරිතෝෂිකය	740,000.00		-
	විගණන ගාස්තුව	(37,500.00)		-
		702,500.00		

14	**දේපළ, පිරියත සහ උපකරණ**			
14.1	**පිරිවැය / තක්සේරුව**			
		2021/1/1 දිනට ශේෂය	අමතර	12/31/2021 දිනට ශේෂය
		රුපියල්	රුපියල්	රුපියල්
	කාර්යාල උපකරණ			
	වායු සමීකරණ	209,000.00		209,000.00
	බයින්ඩින් යන්ත්‍රය	7,000.00	-	7,000.00
	වෙනත් කාර්යාල උපකරණ	55,000.00	-	55,000.00
	ගෘහ භාණ්ඩ සහ උපාංග			

	ගෘහ භාණ්ඩ සහ උපාංග	525,635.00	-	525,635.00
	වාහන			
	මෝටර් රථය	3,100,000.00	-	3,100,000.00
	මෝටර් බයිසිකලය	199,640.00		199,640.00
	පරිගණක උපාංග			
	පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර	1,223,800.00	125,000.00	1,348,800.00
	මුළු වත්කම්	5,320,075.00	125,000.00	5,445,075.00
14.2	**<u>සමුච්චිත ක්ෂය</u>**			
		1/1/2021 දිනට ශේෂය	**ක්ෂය**	12/31/2021 දිනට ශේෂය
		රුපියල්	**රුපියල්**	**රුපියල්**
	කාර්යාල උපකරණ			
	වායු සමීකරණ	209,000.00	-	209,000.00
	බයින්ඩින් යන්ත්‍රය	7,000.00	-	7,000.00
	වෙනත් කාර්යාල උපකරණ	55,000.00	-	55,000.00
	ගෘහ භාණ්ඩ සහ උපාංග			
	ගෘහ භාණ්ඩ සහ උපාංග	525,635.00	-	525,635.00
	වාහන			
	මෝටර් රථය	3,100,000.00	-	3,100,000.00
	මෝටර් සයිකල්	199,640.00	-	199,640.00
	පරිගණක උපාංග			
	පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර	1,223,800.00	27,343.75	1,251,143.75
	මුළු ක්ෂය වීම්	5,320,075.00	27,343.75	5,347,418.75

විගණන වාර්තාවන්



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PSE/D/SLCF/01/21/01
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023 දෙසැම්බර් 15 දින

සභාපති,
ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් පුද්ගලික සමාගම.

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් පුද්ගලික සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් පුද්ගලික සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියට සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන කුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා සුදු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සහය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටු 1 | 10

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naoal.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මිනය සඳහා පදනම

(අ) සමාගම සතු පිරිවැය රු.5,366,485 ක් වූ දේපළ, පිරියත හා උපකරණ වල ඵලදායී ආයු කාලය අවසන් වී පැවතියද විගණිත වර්ෂය තුළදී ද එම වත්කම් භාවිතා කරනු ලබන බවට විගණනයේදී නිරීක්ෂණය විය. මේ අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 17 වන කොටසේ ඡේද අංක 17.1.9 අනුව එම වත්කම් වල ඵලදායී ජීව කාලය නිවැරදිව ඇස්තමේන්තු ගත කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) 2012 වර්ෂයේදී රු.2,500,000 ක පිරිවැයකට අගය කර තිබූ අංක GG-9396 දරන කැබ රථය සමාගම විසින් භාවිතා කරනු ලැබුව ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 2 වන කොටසේ ඡේද අංක 19 අනුව 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබූ මූලාය තත්ත්ව ප්‍රකාශයේ ප්‍රංගම නොවන වත්කම් යටතේ සඳාල වත්කම් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) KJ-4483 මෝටර් රථයේ වාර්ෂික රක්ෂණ මුදල ලෙස රු.43,873 ක මුදලක් 2021 ජූලි 01 දින ගෙවා තිබූ අතර එයින් 2022 වර්ෂයට අදාල රු.14,664 ක පූර්ව උපචිත පදනම යටතේ ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස කපාහැර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රතිනාණ මණ්ඩලය (Accreditation Board) වෙත 2021 ජූලි 01 දින 2021/2022 වර්ෂ සඳහා වාර්ෂික ප්‍රතිනාණ ගාස්තු වෙනුවෙන් ගෙවා තිබූ රු. 150,000 ක සම්පූර්ණ මුදලින් රු.129,863 ක් පමණක් 2021 වර්ෂයට අදාල වූවද එම මුළු මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාගමේ කාර්යාලය 2023 වර්ෂයේදී පරිසර අමාත්‍යාංශ පරිශ්‍රයේ ස්ථාපනය කිරීමට පෙර දැව සංස්ථාවේ ස්ථාපනය කර තිබූ නමුත් 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කාර්යාල කුලිය රු.1,415,849 ක් දැව සංස්ථාව වෙත ගෙවා නොතිබුණි. එසේම 2021 වර්ෂයේ මූලාය ප්‍රකාශන මඟින් මේ සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු අතර ගිණුම්කරණ සටහන් මඟින් ද හෙළිදරවකර නොතිබුණි.

(ඊ) දේශගුණ විපර්යාස අවම කිරීමේ ඖයවරක් වන කාබන් ඩියසටහන් (Carbon Footprint) ක්‍රමය සඳහා අවශ්‍ය සේවා සැපයීම වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබිය යුතු ආදායමක් ලෙස රු.248,482 ක් මෙහෙයුම් ආදායම් යටතේ දක්වා තිබුණි. නමුත් මෙම වැඩසටහන සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සමඟ ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර සමාගම විසින් ද මෙම සේවාව සපයා නොතිබුණි. ඉහත කරුණු අනුව සමාගම විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත 23 වන

කොටසේ 23.14 වගන්තියට පටහැනිව ආදායම් ගිණුම්ගත කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතේ 16 වන වගන්තිය අනුව සේවක අර්ථසාධක අරමුදල සඳහා 2021 වර්ෂයට අදාළ දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම මත රු.259,600 ක අධිභාරයක් පනවා තිබුණ ද 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් අදාළ අධිභාර මුදල භදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම 2021 වර්ෂයට අදාලව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අදාළ දායක මුදල් ප්‍රමාද වී ගෙවීම නිසා රු.29,205 ක අධිභාර මුදලක් ගෙවිය යුතු වුවද ඒ සඳහා ද ප්‍රතිසාදන වෙන්කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) 2021 වර්ෂයට අදාලව අවලංගු කර ඇතැයි පැවසූ ඉන්වොයිස් 07 ක් විගණන කටයුතු සඳහා ඉදිරිපත් නොකළ අතර එම ඉන්වොයිසි අවලංගු කිරීම සඳහා හේතුව විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. සමාගම විසින් ආදායම් රැස් කිරීම හා ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණු අතර ඒ අනුව සමාගම විසින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනා තුළ දක්වා ඇති රු.7,124,960 ක ආදායමේ නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැකි විය.

(එ) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා ඇති 2020 වර්ෂයේ අවසන් දිනට මුදල් හා මුදල් සමාන දෑ වල වර්තමානයේ ලෙස 2020 විගණිත මූල්‍ය ප්‍රකාශනවල දැක්වූ රු.10,071,017.45 ක් සඳහන් වුවද 2021 වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ වල ආරම්භක ශේෂය ලෙස රු.71,017.45 ක් දක්වා තිබුණි.

(ඒ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ 2021 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය නිර්ණය කිරීමේ දී පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම ලෙස රු.702,500 ක් ගැලපීම් සිදු කර තිබුණි.

(ඔ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති වල 10 වන ගණවසේ 10.21 (අ) වගන්තිය අනුව පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීමේදී මූල්‍ය ප්‍රකාශන තුළ පෙර වර්ෂයට අදාල සංසන්දනාත්මක තොරතුරු ද නැවත නිවැරදි ලෙස ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණ ද සමාගම විසින් 2020 වර්ෂයේ වැරදි නිවැරදි කිරීමට අදාල ගෙවිය යුතු පාරිනෝෂික සහ ගෙවිය යුතු විගණන ගාස්තු ලඝයන් නිවැරදි කර ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනා විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නෛතිකවිගණනය කළ

මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම් අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා සුළු හා මධ්‍යසරීමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ පලස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රථාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්ම පදනම් මත ගිණුම් කැරීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවන් සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දූස්ත්‍රාධායෙන්, වාසප ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- පිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිගමනය යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා උපයෝගයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වලංගුභාවය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව නිතුළුන් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණනා පොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරවී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ නක්ත්වාගණනය කළ මනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ නක්ත්වාගණනය කළ මනය සඳහා පදනම කොටසේ 1.2. (ඒ) සහ 1.2. (ඔ) දක්වා ඇති නිරීක්ෂණ හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ නක්ත්වාගණනය කළ මනය සඳහා පදනම කොටසේ 1.2. (අ) දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නැත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාත්මාකාරයකින් යම්කිසි වාණිජමය කරුණක් සම්බන්ධයෙන් බැහැරව සම්බන්ධයක් නැති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16(1) වගන්තිය	සේවා යෝජක විසින් සෑම මසකටම අදාළව සේවා නියුක්තිකයන්ගේ දායක මුදල් ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට පූර්ව මණ්ඩලය වෙත යොමු කළ යුතු වුවත් සමාගම විසින් දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම නිසා සමාලෝචන වර්ෂය තුළ රු.15,723 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි.
(ආ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 120(ඒ) කොටස	සේවායෝ විසින් සේවකයින්ගෙන් උපයන විට බදු ගෙවීම් ලෙස මාසිකව අඩුකරගන්නා ලද මුදල් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු වුවද 2015, 2016 හා 2017 වර්ෂවල සමාගමේ සේවයේ නියුක්තව සිටි ප්‍රධාන විධායක නිලධාරි හා මූල්‍ය නිලධාරිගේ උපයන විට ගෙවීම් බදු ලෙස අඩුකර ගෙන තිබූ රු.326,000 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.
(ඇ)	2007 අංක 07 දරන සමාගම් පනත 131 (1) වගන්තිය	i. සෑම සමාගමක්ම පස්වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කාරණා ඇතුළත් වාර්ෂික වාර්තාවක්, යටත් පිරිසෙයින් සෑම වර්ෂයකටම වරක් නියමිත ආකෘතියෙහි රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු වුවද සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	223 (1) වගන්තිය	ii.	මෙම වගන්තිය ප්‍රකාර සමාගම විසින් අධ්‍යක්ෂකවරයන් හා ලේකම්වරයන් සිදුකළ ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.
	223 (2) වන උප වගන්තිය (අ) , (ආ)	iii.	2020 හා 2021 වර්ෂයන්හි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය හා ලේකම්වරු වෙනස් වී තිබුණද මෙම වගන්තිය ප්‍රකාරව එම වෙනස ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකෘතියට අනුව රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.
(අ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛය		
(i)	මාර්ගෝපදේශ අංක 2.3	සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම සමඟ ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
(ii)	මෙහෙයුම් අත්පොත ඡේද අංක 2	මෙහෙයුම් අත්පොතේ 2 ඡේදය ප්‍රකාරව සමාගම විසින් මෙහෙයුම් පද්ධති සහ පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර නොතිබුණි.	
(iii)	මෙහෙයුම් අත්පොත ඡේද අංක 3.1 (i)	2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ කාර්යමණ්ඩලය 08 දෙනෙකු වුවත් සමාගමේ බිඳවා ගැනීමේ පටිපාටිය හෝ කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	
(ii)	මෙහෙයුම් අත්පොත ඡේද අංක 6.7	සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.	

(iii) මෙහෙයුම් අත්පොත ඡේද අංක 7.3		සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූලික කාර්යසාධන දර්ශක (KPI) අනුමත ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය සමඟ (KPI) කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි.
(iv) මෙහෙයුම් අත්පොත ඡේද අංක 7.4		අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය, කාරක ප්‍රාග්ධනය, මුදල් ප්‍රවාහයන්, ද්‍රවශීලතා මට්ටම සහ ණය තත්ත්වයට (Debt Position) අදාළ වාර්තාවන් මාසිකව පරීක්ෂා කර නොතිබුණි.
(v) මෙහෙයුම් අත්පොත ඡේද අංක 7.5		සමාගම විසින් මාසිකව, කාර්තුමය හා වාර්ෂිකව පිළියෙළ කරනු ලබන කාර්ය සාධන වාර්තා මහා භාණ්ඩාගාරයට යොමු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කෙරෙහිමාවන් තුළ අදාළ ඒකීරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව

(අ) සමාගම විසින් රු.209,000 කට මිලදී ගෙන ඇතැයි සඳහන් වායු සම්කරණ යන්ත්‍රයක් මේට ඉහත සමාගම් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ සවිකර ඇති බව සඳහන් කර ඇති අතර එම වායු සම්කරණ යන්ත්‍රය වර්තමානයේදී සමාගමේ කටයුතු සඳහා උපයෝජනය නොකරන බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ රු.125,000 ක පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 හි අපේක්ෂිත අරමුණු වන ප්‍රසම්පාදනයේ ආර්ථිකමය, කාලෝචිත බව සහ ගුණාත්මකභාවය උපරිම කිරීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) සමාගමේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ තොරතුරු 2023 ජූලි 27 දින විගණනය වෙත ලබාදෙන ලෙස දන්වා සිටියද 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය අනුව විගණන කටයුතු සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව 2021 මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ විගණන විෂය පථය සීමා වී තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන වක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 6.6 අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා අවසන් ගිණුම් මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් මාස 20 ක් ප්‍රමාද වී එනම් 2023 ඔක්තෝබර් 30 වන දින ඉදිරිපත් කර තිබුණි.

(ඇ) දේපළ පිරියත හා උපකරණ වලට අදාළ ජංගම නොවන වත්කම් ගිණුම් සහ එම වත්කම් වලට අදාළ ක්ෂය වෙයෑකිරීමේ ගිණුම් ද සොදු ලේජරය තුළ නිරූපණය නොවූ අතර ශේෂ පිරින්සුම් තුළද එම අගයන් දක්වා නොතිබුණි.

ඩබ්.ජී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

විගණන වාර්තාවන් සඳහා පිළිතුරු

විගණකාධිපති.

ජාතික විගණන කාර්යාලය,

මහත්මයාණෙනි,

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ ලිපි අංක PSE/D/SLCF/01/21/01 දරන 2021 නොවැම්බර් 28 වන දිනැති ලිපිය හා බැඳේ. එම ලිපියේ සඳහන් කරුණු වලට පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

1.2 මතය සඳහා පදනම

(අ) සමාගමේ වර්තමාන මූල්‍ය තත්වය අනුව වත්කම් තක්සේරු කිරීම හා ප්‍රත්‍යාගණනය වෙනුවෙන් වියදම් දැරීම අපහසු තත්වයක් ඇත. නමුත් මෙය ඉතා අත්‍යවශය කාර්යයක් වන බැවින් ඉදිරියේදී මෙම කටයුතු අවසන් කිරීමට කටයුතු කරමි.

(ආ) මෙම කැබ් රථය ලේකම්, පරිසර අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කැබ් රථයක් වන අතර එය සමාගමට පවරා ගත් පසු වත්කම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරමි.

(ඇ) මෙවැනි ගනුදෙනු ඉදිරි වර්ෂවලදී නියමිත පරිදි වාර්තා කිරීමට කටයුතු කරමි.

(ඈ) මෙවැනි ගනුදෙනු ඉදිරි වර්ෂවලදී නියමිත පරිදි වාර්තා කිරීමට කටයුතු කරමි.

(ඉ) සමාගමේ මූල්‍ය තත්වය මත මෙම මුදල් නිරවුල් කිරීමට මේ දක්වා නොහැකි වී ඇති නමුත් ඉදිරියේදි මෙය ගෙවීමට කටයුතු කරමි.

(ඊ) මෙම සේවාව මේ දක්වා ඉටු කර නොමැති අතර මධ්‍යම පරිසර අධිකාරිය මේ පිළිබඳව අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය කරමි. එබැවින් මේ පිළිබඳව තව දුරටත් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරු ලැබේ.

(උ) ඉදිරි වර්ෂවල ගිණුම් පිළියෙළ කිරීමේදී මෙවැනි ගනුදෙනු සඳහා වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කරන ලැබේ.

(ඌ) 2021 වර්ෂයේ අවලංගු කරන ලද ඉන්වොයිස් 07 ක පිටපත් විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලද අතර ඉදිරිපත් කරන ලද ඉන්වොයිස් වල වටිනාකම මුල්‍ය ප්‍රකාශන වල සඳහන් කර ඇත.

(එ) 2020 වර්ෂයේ ස්ථාවර තැන්පතුව මුදල් හා මුදල් සමාන දෑ යටතේ වාර්තා කර තිබූ අතර 2021 වර්ෂයේදී එම ස්ථාවර තන්පතුව ජංගම නොවන වත්කම් යටතේ වාර්තා කර ඇත.

(ඒ) පසු ගිය විගණන නිරීක්ෂණ අනුව මෙම ගැලපීම සිදු කර ඇත.

(ඔ) ගෙවිය යුතු පාරිතෝෂිකය සහ එවිය යුතු විගණන ගාස්තු වල නිවැරදි වටිනාකම ගිණුම් වල දක්වා ඇත.

නීති රීති/ විධානයට නිරීක්ෂණ යොමුව

(අ) මෙම සුළු මුදල් ගෙවීම සාමාන්‍ය මුදල් පොතේ සටහන් කර ඇත. සුළු මුදල් පොත පරිගණක එක්සෙල් (Excel) මගින් නඩත්තු කර ඇත.

(ආ) මෙම ප්‍රමාදයන් ඉදිරියේ දී වලක්වා ගැනිමට කටයුතු කරනු ලැබේ.

(ඇ) මෙම සියලු ගෙවීම් මේ වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා අවසන් කර ඇති අතර වර්තමාන ගෙවීම් ප්‍රමාදයකින් තොරව නිසි පරිදි සිදු කරනු ලැබේ.

(ඈ)

(i) 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ වන විට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් වාර්ෂික වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ii) මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(iii) මේ පිළිබඳව සමාගම් ලේකම්වරයා විසින් කටයුතු කරගෙන යනු ලැබේ.

(ඉ)

(i) මේ වන විට උපායමාර්ගික සැලැස්ම රාජ්‍ය ව්‍යාපර දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

(ii) මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(iii) උපායමාර්ගික සැලැස්ම අනුමත වීමෙන් පසුව කාර්ය මණ්ඩලය අනුමත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) ඉදිරියේ දී මේ පිළිබඳව කටයුතු කරනු ඇත.

(iii) කාර්ය සාධන දර්ශක සකස් කර සංයුක්ත සැලැස්මට ඇතුළත් කර ඇති අතර ඉදිරියේදී සමාලෝචනයට ඉදිරිපත් කරනු ලැබේ.

(iv) මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(v) මෙම වාර්තාව අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

2.2.4 2018 අංක 18 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන්අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුල අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) මෙම ස්ථාවර තැන්පතුව වර්ෂිකව අලුත් වන ලෙස ආයෝජනය කර තිබූ අතර එක් එක් වර්ෂයේදී අදාළ පොලී අනුපාතිකයන් අනුව සමාගමට පොලී අදායම ලැබී ඇත. ඒ අනුව සෑම වර්ෂයකටම බලපාන ලද පොලී අනුපාතිකය 11.75% නොවන බව දන්වා සිටින අතර 2023.06.22 වන දින සිට නැවත අලුත් වීමේදී සමාගමට හිමි වී ඇති පොලී අනුපාතිකය 11% කි.

(ආ) මෙම වායු සමීකරණ යන්ත්‍රය මීට ඉහත දී සමාගමේ කාර්යාලය තිබූ ගොඩනැගිල්ලේ සවි කර ඇත. එම ගොඩනැගිල්ලෙන් ඉවත් වීමෙන් පසුව වායු සමීකරණ යන්ත්‍රය ලබා ගැනීමට කටයුතු කරන ලද නමුත් එය ලබා ගැනීමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී මෙය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඇ) ඉදිරියේදී මෙම ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සිදු කරනු ලැබේ

2.3 වෙනත් කරුණු

(අ) ඉදිරියේදී වාර්ෂික වාර්තාවන් ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

(ආ) ඉදිරියේදී සමාගමේ අලෙවි ප්‍රවර්ධන සැලසුම් අනුව මේ පිළිබඳව අවධානය යොමු කරන ලැබේ.

(ඇ) ඉදිරියේදී මේ පිළිබඳව නිවැරදි කරමි.

.....

කේ.එච්.එම්. එච්.එච්. අබේරත්න

ප්‍රධාන විධායක නිළධාරි - වැ. බ

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම